වාර්ගිකත්වයන් හෝ ආගමිකත්වයන් පදනම් කරගනිමින් ඇතිවන අසමගිකම් හෝ ප්‍රචණ්ඩත්වයන්ට ජනමාධ්‍ය විසින් දැනදැනම හෝ හිතාමතාම හෝ අනුබල නොදිය යුතු බව ජනමාධ්‍ය ආචාර ධර්මයකි. කොවිඩ්-19 පසුබිමේදී මරණ, රෝගීන්/නිරෝධායනයට ලක් කරන පුද්ගලයින්ගේ ජාතිය සහ ආගම කිසිවිටකත් සඳහන් නොකරන ලෙසට සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයෙන් ජනමාධ්‍ය වෙත නිකුත් කොට ඇති නිර්දේශයේද සඳහන් වේ. එසේ වුවත් ඇතැම් ජනමාධ්‍ය මෙම ආචාර ධර්මයන් සහ නිර්දේශයන් කෙතරම් දුරට පිළිගෙන ඇතිදැයි පැනයක් නැගේ. මව්බිම සහ අද දෙරණ මීට උදාහරණ වේ.

ප්‍රවෘත්තියට සෘජුවම අදාළ නොවනා මොහොතක මෙසේ වාර්ගිකත්වය හෝ ආගමිකත්වය සඳහන් කිරීමෙන් රෝගීන්/නිරෝධායනයට යොමු කරවූවන් ඇතැමෙකුගේ ගර්හාවට සහ කොන් කිරීමට ලක්වීමත්, කොවිඩ්-19 මර්දන කටයුතු වලට බාධා ඇතිවීමත් සිදුවිය නොහැකිද? මේ සම්බන්ධව ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #TV #News #COVID19 #Coronavirus
#TVDerana #Mawbima